# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1986/56 - 2016 සැප්තැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

100%ක ආනයන බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරන ලද වාහන අපහරණය සඳහා, 2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ 'ඉ' උපලේඛනය යටතේ රේගු වටිනාකම නියම කිරීමේ ක්‍රමය

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ 'ඉ' උපලේඛනය යටතේ ඇති විධිවිධානයන්ට අනුව 2015 නොවැම්බර් මස 19 වැනි දින හෝ ඊට පෙර 100%ක ආනයන බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරනු ලැබූ හා ලියාපදිංචි කරනු ලැබූ මෝටර් රථ අපහරණය සඳහා රාජ්‍යතාන්ත්‍රිකයන් හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධාන වලට රේගු වටිනාකම නියම කිරීමේ ක්‍රමය මෙයින් නියම කරනු ලැබේ.

ඒ අනුව, 2015 නොවැම්බර් මස 19 දින හෝ ඊට පෙර 100%ක ආනයනය බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරනු ලැබූ හා ලියාපදිංචි කරනු ලැබූ මෝටර් රථ අපහරණය සඳහා රාජ්‍යතාන්ත්‍රිකයන් හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධාන වලට ආනයනය කරන ලද කාලය හා අපහරණය කරනු ලබන කාලය අතර වාහනය භාවිතා කරනු ලැබූ කාල සීමාව පදනම් කරගෙන වටිනාකමත්, ආනයනය කරනු ලබන කාලයේ දී එකී වාහනයේ මි. ර. ගැ. වටිනාකමත් පහත වගුව 1හි දැක්වේ.

අදාළ වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය හා අපහරණය කරනු ලබන කාලය අතර වාහනය භාවිතා කරනු ලැබූ කාල සීමාව වශයෙන් ගණනය කරනු ලැබේ. වාහනය අපහරණය කරනු ලබන අවස්ථාවේ දී ගෙවිය යුතු බද්ද එකී වාහනය ආනයනය කරන ලද අවස්ථාවේ දී පැවති බදු පදනම අනුව ගණනය කළ යුතු ය.

වගුව (1)

| *ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනයේ සිට රාජ්‍යතාන්ත්‍රිකයන් හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධාන විසින් භාවිතා කරනු ලැබූ කාලය* | *මි. ර. ගැ. වටිනාකම (CIF Value)* |
|---|---|
| වසර 01 කට අඩු | 85% |
| වසර 01 කට වැඩි හා වසර 02කට අඩු හෝ සමාන | 75% |
| වසර 02 කට වැඩි හා වසර 03කට අඩු හෝ සමාන | 65% |
| වසර 03 කට වැඩි හා වසර 04කට අඩු හෝ සමාන | 55% |
| වසර 04 කට වැඩි හා වසර 05කට අඩු හෝ සමාන | 45% |
| වසර 05 කට වැඩි හා වසර 06කට අඩු හෝ සමාන | 35% |
| වසර 06 කට වැඩි හා වසර 07කට අඩු හෝ සමාන | 25% |
| වසර 07 කට වැඩි හා වසර 08කට අඩු හෝ සමාන | 15% |
| වසර 08 කට වැඩි | 10% |

රාජ්‍යතාන්ත්‍රික සංවිධාන වලට ආනයනය කරන ලද ''වෙඩි නොවදින'' (සැහැල්ලු ආරක්ෂිත ආවරණයක් සහිත) මෝටර් රථයක් කැබලි වලට වෙන් කර විනාශ කිරීමේ අරමුණෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ එකගතාවය ඇතිව විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය කර ඉදිරිපත් කරන්නේ නම්, එම යකඩ සුන්බුන් සඳහා ගෙවිය යුතු බදු අයකර ගැනීමට යටත්ව මුදල් අමාත්‍යාංශයට එකී මෝටර් රථය අපහරණය කිරීම සඳහා අනුමැතිය දීමට සලකා බැලිය හැක.

2003 අංක 2 දරන රේගු සංශෝධිත පනතේ ''ඉ'' උපලේඛනය යටතේ පළ කරන ලද අංක 1976/5 හා 2016.07.20 දිනැති ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරමි.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 29 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

10-500

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.